3. 0 රජය සමග සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර කරගෙන යාමේ අවශ්‍යතාව

3. 1 රජය, ව්‍යාපාරවලට මැදිහත් වන ආකාරය

ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම පහත ආකාරවලින් සිදුවේ.
● මධ්‍යම රජය ● පළාත් සභා ● පළාත් පාලන ආයතන (මහ නගර සභා/නගර සභා/ප්‍රාදේශීය සභා )

රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාරය සඳහා නිදසුන් කීපයක් පහත දැක්වේ.

- යටිතල පහසුකම් සැපයීම.
  නිදසුන් : මධ්‍යම රජය - විදුලිය සැපයීම, පළාත් සභා - මාර්ග නඩත්තුව, පළාත් පාලන ආයතන අපද්‍රව්‍ය ඉවත් කිරීම.

- තරගකරුවකු වීම.
  නිදසුන් : මධ්‍යම රජය - පෞද්ගලික අංශයේ රූපවාහිනි නාලිකා සමග තරගකාරීව රාජ්‍ය අංශයේ රූපවාහිනි නාලිකා ක්‍රියාත්මක කිරීම.
  පළාත් සභා - ඒ ඒ පළාත් සභා යටතේ පෞද්ගලික අංශය හා තරගාකාරිව ව්‍යාපාර පවත්වා ගෙන යාම, පළාත් පාලන ආයතන - පෞද්ගිලක අංශය හා සමානව වෙළඳසැල් ඉදිකර කුලියට දීම.

- ගනුදෙනුකරුවෙකු වීම.
  නිදසුන් : මධ්‍යම රජය - වී මිලදී ගැනීම, විවිධ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම, ලක් සතොස හරහා භාණ්ඩ විකිණීම. පළාත් සභා - ආරක්ෂක සේවා ලබා ගැනීම හා ලබාදීම. පළාත් පාලන ආයතනය - ආදාහනාගාර පවත්වා ගෙන යාම.

- ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
  නිදසුන් : මධ්‍යම රජය - ප්‍රතිපත්ති හා පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. පළාත් සභා -ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම. පළාත් පාලන අයතන - පරිසර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

- නීති රීති පැනවීම.
  නිදසුන් : මධ්‍යම රජය - පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත, ප්‍රමිති පනත. පළාත් සභා - පෞද්ගලික බස් රථ සඳහා නීතිරීති පැනවීම. පළාත් පාලන ආයතන - ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා නීති රීති පැනවීම.

- බදු අයකරන්නෙකු වීම.
  නිදසුන්: මධ්‍යම රජය- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා බදු අය කිරීම.පළාත් සභා - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් බදු අය කිරීම. පළාත් පාලන ආයතන - වරිපනම් බදු අය කිරීම.

- රජයේ ව්‍යාපාරවලට ලැබෙන සහාය හා මගපෙන්වීම වැදගත් වන ආකාරය :
  ව්‍යාපාර ලියාපදිංචියට යොමු වීම, කීර්තිනාමය වර්ධනය වීම, රටේ සංවර්ධනයට දායක වීම, රජයේ හා මහජනයාගේ පිළිගැනීම ලැබීම.

**ඇගයීම** :
පහත දැක්වෙන ව්‍යාපාර කෙරෙහි අවධානය යොමු කරන්න.
වී වගා කරන ගොවිපළක්, ඇගලුම් අපනයන කරන ආයතනයක්, මගී ප්‍රවාහන සේවා සපයන ආයතනයක්.

- මෙම ව්‍යාපාර ඔබ විසින්ම පවත්වාගෙන යන බව උපකල්පනය කරන්න.
- මෙම ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා රජයෙන් ලබාගත හැකි සහායන් සඳහන් කරන්න.
- අදාල ව්‍යාපර ආයතනය නිවැරදි මාර්ගයේ ගමන් කරවීම සඳහා රජය ලබා දෙන්නාවූ මග පෙන්වීම් දක්වන්න.
- එම සහායයන් හා මගපෙන්වීම් ලබාදෙන රජයේ ආයතන ලැයිස්තු ගත කරන්න.
- එම ආයතන මධ්‍ය රජය, පළාත් සභා, පළාත් පාලන ආයතන යටතේ වර්ග කරන්න.
- රජය එම සහායයන් හා මගපෙන්වීම් සැපයීම වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.